## 181 වෙමි මම මිදි වැල

වෙමි මම මිදි වැල පවසමි ඉඳුරා - මිදි වැල මමයි හැබෑ
මිදි උයනේ පාලකයෝ - වෙති මගේ පියාණනෝ

ඇඳෑ ඇඳෑ සිත්තම් ළකරින උපමා
දෙසූහ ලොව්තුරු දහම් ඔබේ
ඒ සුබ අස්නේ දිවමන් වචනේ
දුවයි දුවයි ලෝ සතර අතේ //

මා තුළැ ඇති හැම අතු පල නොදරන
දමනු ලැබේ එකිනෙක සිඳලා
පල දරනා අතු පැහැ පැහැ දමනෝ
පල වැඩි වැඩියේ දෙනු සඳහා //

මම වෙමි මිදි වැල, ඔබ එහි අතු වෙති
කවුරුද මා හා එක් වන්නේ
පල දරනු ඇතේ ඉබොහෝ හෙතෙමේ
ලබමින් නිතොරවැ මා ජීවේ //

නොහැකිය කිසිවක් ඔබහට කරනට
නොමැතිවැ මා හා එකට බැඳී
ඇතිනම් ඔබ තුළැ වචනේ මාගේ
ඔබ ඉල්ලන හැම දෙයක් ලැබේ //

සම්දේ මේ උපමාවෙ කතා වේ - ගැඹුර අරුත් තොරා දෙන්නේ
කිතුනුවනේ ඒ අප ජීවිතයේ - පරමානන්දේ විය යුතුවේ //

කිඳැවී ඔබෙ හද ඇතුළට කිඳැවී - තේරුම් ගන්නට දෙනු සම්දේ
සුදතුන් දැණත් වරම් ප්‍රසාදේ - ගතවූවෝ අපි කිතුන් බදේ